| 115. | යතුරු ලියන යන්ත්‍ර | | 11 |
| 116. | ඡායා පිටපත් යන්ත්‍ර | | 02 |
| 117. | වතුර මෝටර්, ජිනසේන සෙන්ට්‍රික් | | 01 |
| 118. | විදුලි පංකා - සිවිලිං KDK | | 01 |
| 119. | විදුලි පංකා - සිවිලිං | | 01 |

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාතලේ, ගොංගාවෙල පාර, අංක 4/3 හි පදිංචි සෙයිනුල් ආබ්දීන් හම්සා (ජා. හැ. අංක 493501070 වී) වන මා විසින් මහනුවර, පේරාදෙණිය පාර අංක 156/23 හි පදිංචි මොහමඩ් ගවුස් අමානුල්ලා කාන් (ජා. හැ. අංක 493254197 වී) වෙත ලබාදුන් නීතිඥ ප්‍රසිද්ධ නොතාරිස් තැන ඉසඩ් පී. එච්. නජීල් මිය විසින් සහතික කරන ලද අංක 16086 හා 2014.03.04 දිනැති ඇටෝර්නි බලපත්‍රය වහාම බල පැවැත්වෙන පරිදි නැවත ලබා ගන්නා බවත්, අවලංගු කරන බවත්, මින් ඉදිරියට එම බලපත්‍රය අනුව ඔහු විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට මා වගකීම භාර නොගන්නා බවත් එම බලපත්‍රය බල රහිත හා නීත්‍යානුකූල නොවන බවත් මෙයින් ශ්‍රී ලංකාවාසී සියලු පොදු ජනතාවට දන්වමි.

සෙයිනුල් ආබ්දීන් හම්සා.

12-549

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව දැනුම්දීම

පන්නිපිටිය කොට්ටාව දුම්රිය මාවත, අංක 632/1 දරන ස්ථානයෙහි පදිංචි අමරසිංහගේ ප්‍රේමසීලි වන මම රත්නපුර තිරිවානකැටිය කැටන්දෙලවත්ත අංක 96 දරන ස්ථානයෙහි පදිංචි ඩෙන්සිල් අල්විස් කොතලාවල යන අයට දයන්ත එන්. හේවාවිතාරණ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කළ අංක 2008 සහ 2016.02.29 දිනැති ඇටෝර්නි බලපත්‍රය මගින් මා නමින් සහ මා වෙනුවෙන් දී තිබූ ඇටර්නි බලය 2016.12.16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඔහු විසින් හෝ එකී බලපත්‍රයේ බලය මත ඔහු යටතට නොහොත් ඔහු වෙනුවට පත් කරගත්තා වූ ඇටෝර්නි බලකාරයන් එක් අයෙක් හෝ වැඩි දෙනෙක් හෝ කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

අමරසිංහගේ ප්‍රේමසීලි.

12-574

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : සිප්රිනි බව (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 117630
ලියාපදිංචි ලිපිනය : අංක 40, ගෝල්ෆේස් කෝට් 02, කොළඹ 03.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී වී 5958

12-588

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම පහත පළ කෙරේ.

සමාගමේ නම : පාම් හවුස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 118009
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාගත කළ දිනය : 2016 නොවැම්බර් මස 21 වැනි දින

කෝපරේට් ඇඩ්වයිසර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

12-598

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම අප විසින් පහත පළ කෙරේ.

සමාගමේ නාමය : නියෝ පවර් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 116995
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 85/7ඊ අංක 17, සේනානායක මාවත, නාවල.
සංස්ථාගත කළ දිනය : 2016 ඔක්තෝබර් මස 05 වැනි දින

එච්. එෆ්. එන්. වී. ෆොන්සේකා මයා,
සමාගම් ලේකම්.

12-599

---

## දැනුම්දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තියේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගම් නාමය :බී. බී. බී. හෝල්ඩිංස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 116988
ලියාපදිංචි ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7.
සංස්ථාගත දිනය : 2016.10.05

සමාගම් ලේකම්වරු.

12-600

## දැනුම්දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තියේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දනුම් දෙමු.

සමාගම් නාමය : කයිට්ලන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 117075
ලියාපදිංචි ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7
සංස්ථාගත දිනය : 2016.10.12

සමාගම් ලේකම්වරු.

12-601

---

## දැනුම්දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දන්වීම පහත පළ කෙරේ.

සමාගමේ නම : පැරඩයිස් ප්ලාන්ටේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 118197
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 49/1, රොස්මීඩ් පෙදෙස, කුරුඳුවත්ත, කොළඹ 7
සංස්ථාගත කළ දිනය : 2016 නොවැම්බර් මස 22 වැනි දින.

කෝපරේට් ඇඩ්වයිසර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

12-602

---

## දැනුම්දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දන්වීම පහත පළ කෙරේ.

සමාගමේ නම : වික්ටෝරියා කැපිටල් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 117937
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : එයිට්කන් ස්පෙන්ස්, 1 කුළුණ, 5 වැනි මහල, අංක 315, වොක්ෂෝල් වීදිය, කොළඹ 2
සංස්ථාගත කළ දිනය : 2016 නොවැම්බර් මස 17 වැනි දින.

කෝපරේට් ඇඩ්වයිසර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

12-603

---

## දැනුම්දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ දනුම්දීමයි.

සමාගමේ නාමය : එක්ස්ප්‍රස් 418 (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 103497
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 716/16, කුලසෙවණ මාවත, කොට්ටාව, පන්නිපිටිය
සංස්ථාගත කළ දිනය : 2015.01.26

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

දිනූෂ කෝන්කඩුව,
අධ්‍යක්ෂ.

12-604

---

## ඇටෝර්නි බලපත්‍රයක් නිත්‍යානුකූලව අවලංගු කරගැනීම

ජර්මනිය, වුප්පර්ටල්, 42103, හෝෆාවු 81 දරන ලිපිනයෙහි සහ කලින් අච්චුවෙලි, පාතමනි හි පදිංචි රත්නසාමි සිට්පරසිගාමනි වන මා විසින්, වර්ෂ 1997.10.20 වැනි දින ජර්මනියේ ප්‍රසිද්ධ නොතාරිස් හර්න් රෙයිනර් ක්ලෝ විසින් ලියා සහතික කරන ලද, යාපනය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඇටෝර්නි බලපත්‍ර පොතේ අංක 84 කාණ්ඩයේ 8742 පත්ඉරුවේ අංක 182 දරන දිනපොතේ අංකය යටතේ වර්ෂ 1997.11.27 වැනි දින ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මගින් අච්චිවෙලි, පාතමනි දරන ස්ථානයේ පදිංචි තවමනි රත්නසාමි වෙත පවරන ලද ඇටෝර්නි බලය අද දින සිට අවලංගු හා බල රහිත ශුන්‍ය වන බව මෙයින් සියලු දෙනාගේ ම හා ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ දනගැනීම පිණිස දන්වන අතර, එකී බලපත්‍රය යටතේ ඇටෝර්නි බලකරු වශයෙන් ක්‍රියා කිරීමෙහි සිදුවන ඕනෑම කටයුත්තක් සඳහා මම කිසිදු වගකීමක් භාර නොගන්නා බවත් දන්වා සිටිමි.

රත්නසාමි සිට්පරසිගාමනි.

12-629

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 5 වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනය

සමාගමේ නම : ලුරෙ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලි.ප. ලිපිනය : අංක 72, ''නේවර් පැරඩයිස්'' පන්සල පාර, ඒකල, ජාඇල
ලියාපදිංචි දිනය : 2016 නොවැම්බර් මස 11 වැනි දින,
ලියාපදිංචි අංකය : පීවී 118006

ටී. ජී. වී. රත්නායක,
සමාගම් ලේකම්.

12-652

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

හොරණ, දෙඹගොඩ, කටුගහවත්ත, අංක 356/ඒ/6 හි පදිංචි පැලවත්ත හෙට්ටිගේ රූපවතී වන මම, ටී. වජිරා මල්කාන්ති ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2015.09.11 වැනි දින ලියා සහතික කරන ලද අංක 1591 දරන ඇටර්නි බලපත්‍රය මගින් පැටිකිරි කෝරළගේ නිරෝෂා යන අයට පවරා තිබූ ඇටෝර්නි බලය වර්ෂ 2016.11.19 වැනි දින සිට අවලංගු කරන ලද බව සියලු දෙනාගේ ම දැන ගැනීම පිණිස දන්වා සිටිමි. එකී ඇටෝර්නි බලපත්‍රය මත මින් ඉදිරියට මා වෙනුවෙන් ඇය විසින් කරන ලද කිසිදු කටයුත්තකට වග නොකියන බව ප්‍රකාශ කරමි.

12-656

---

## නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිරෝකෙම් මෙඩිකල් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 30 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : නිරෝකෙම් මෙඩිකල් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 116869
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 441/7, 2 වන පටුමග, කොටා පාර, රාජගිරිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව,

කෝ-සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

12-663

---

## නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ රෝයලි හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2016ක් වූ ඔක්තෝබර් මස 19 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : රෝයලි හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 117388
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 261/1, පමුණුව පාර, මහරගම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව,

කෝ-සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

12-664

---

## නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ ක්‍රිප්ටෝ ජෙනෙටික්ස් (පීවීටී) එල්ටීඩී 2016.11.21 වැනි දින සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ. පීවී 118106, 88/2, ස්ටොන් පෙදෙස, මරදන, කොළඹ 10.

අධ්‍යක්ෂ.

12-673

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| *ලියාපදිංචි සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|---|
| ගුරුගේ ග්‍රීන් එනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ් | පී. වී. 116996 | 2016.10.05 | අංක 15, විද්‍යාල මාවත, කහවත්ත |
| සොලෙටිකෝ ඉන්ජිනියරින් ඇන්ඩ් කන්සල්ටන්සි සර්විසස් (පීවීටී) එල්ටීඩී | පී. වී. 117477 | 2016.10.24 | අංක 153 (77) කොළඹ පාර, බෝකුන්දර, පිළියන්දල. |

ආර්. කේ. එල්. එස්. කෝපරේට් සර්විසස් (පීවීටී) එල්. ටී. ඩී.
සමාගම් ලේකම්වරු.

12-636

## ප්‍රසිද්ධ දැන්වීමයි

ආට් ලංකා ගැලරි (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 64224), කාලාලංකා වන් (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 71199), කාලාලංකා ටූ (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 71203) සහ සියරන්ට් ආට් (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 78194) යන සමාගම් ඒකාබද්ධ වීමේ නිවේදනයයි.

ආට් ලංකා ගැලරි (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 64224), කාලාලංකා වන් (ප්‍රයිවට්) ලිමටඩ් (පී වී 71199), කාලාලංකා ටූ (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 71203) සහ සියරන්ට් ආට් (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 78194) යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයන් මත අදළ සමාගම් හතර, 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කොට, තවදුරටත් ආට් ලංකා ගැලරි (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 64224) යන නාමය යටතේ තනි සමාගමක් වශයෙන් පවත්වාගෙන යාමට තීරණය කර ඇත.

මෙම ඒකාබද්ධ කිරීම සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් අනුමත කරන දිනයක සිට ක්‍රියාත්මක වීමට නියමිතයි.

අධ්‍යක්ෂවරු.

ආට් ලංකා ගැලරි (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 64224)
කාලාලංකා වන් (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 71199)
කාලාලංකා ටූ (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 71203)
සියරන්ට් ආට් (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 78194)

12-590

## ඇටර්නි බලකරය අවලංගු කිරීම

පිළිමතලාව, ගංගොඩ අංක 69/4/3 දරන තැන පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 832420956 V හිමි තිළිණ මධුශංක තෙන්නකෝන් රාජපක්ෂ වන මම මෙකී දැන්වීම ලබන සියලු දෙනාගේ දැන ගැනීම සඳහා ප්‍රකාශ කර සිටින වග නම්,

එකී තිළිණ මධුශංක තෙන්නකෝන් රාජපක්ෂ වන මා විසින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. අබේරත්න බංඩාර විසින් 2014ක් වූ දෙසැම්බර් මස 20 වැනි දින ලියා සහතික කරන ලද අංක 18923 දරන ඇටර්නි බලපත්‍රය 2016 ක් වූ දෙසැම්බර් මස 08 වැනි දින සිට බලපවත්වන පරිදි අවලංගු කරන බවත්, ඒ අනුව එකී ඇටර්නි බලපත්‍රය මා විසින් බලය දෙනු ලැබූ ඇටර්නි බලකාරයන් වන පිළිමතලාව, ගංගොඩ, අංක 69/3/4 දරන තැන පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ සීතා තෙන්නකෝන් යන අය තවදුරටත් මාගේ ඇටෝර්නි බලකරු ලෙස ක්‍රියා නොකරන බවත්, ඇය විසින් මෙදින සිට මා වෙනුවෙන් මාගේ නමින් යැයි ප්‍රකාශ කරමින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් මාගේ නමින් හෝ මා වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවක් ලෙස මා විසින් වග නොකියන බවත්, සියලු දෙනා ම මෙයින් දැනගත යුතු ය.

තිළිණ මධුශංක තෙන්නකෝන්.

2016 දෙසැම්බර් මස 08 වැනි දින.

12-1085

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ වර්ෂ 2017ක් වූ ජනවාරි මස 11 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ, (පුත්තලම ලියාපදිංචි කොට්ඨාසය තුළ) පුත්තලම දිස්ත්‍රික්කයේ දෙමළ හත්පත්තුවේ රජවන්නි පත්තුවේ කරුවලගස්වැව ප්‍රාදේශීය සභා සීමාවේ කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි කරුවලගස්වැව අංක 640 සී දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මහ කරඹෑව ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ගුණසේකර විසින් මැන සාදන ලද 2015.03.29 දිනැති අංක 6028 දරන පිඹුරේ දැක්වෙන,

(1) පලුගහහේන වැවළඩකැලේ මූකලාන වැවළඩ මූකලාන ගල්කන්ද කැලේ සහ වැවඉහල මූකලාන බෙද වෙන් කළ ලොට් J 1 නමැති ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද,

විශාලත්වය - අ. 18, රූ. 2, පර්. 19.41

(2) පලුගහහේන වැවළඩකැලේ මූකලාන වැවළඩ මූකලාන ගල්කන්ද කැලේ සහ වැවඉහළ මූකලාන බෙද වෙන් කළ ලොට් B 1 නමැති ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද වේ.

විශාලත්වය - අ. 0, රූ. 2, පර්. 31.7

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එල්. වඩුතන්ත්‍රි විසින් සහතික කරන ලද වර්ෂ 2015 ක් වූ ඔක්තෝබර් මස 07 වැනි දිනැති අංක 354 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදු කිරීම මෙරිඤ්ඤගේ සුවිනීතා කුසුම් ප්‍රනාන්දු සහ දිල්ලිමුණි රිස්ලි රසංජන් සිල්වා විසින් ''බන්ධනදයින්'' ලෙස ද මෙරිඤ්ඤගේ සුවිනීතා කුසුම් ප්‍රනාන්දු ''උකස්කරු'' ලෙස ද පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2016.11.25 වැනි දිනැති *රජයේ ගැසට් පත්‍රය* ද, වර්ෂ 2016.11.25 වැනි දිනැති ලක්බිම, ඩේයිලි නිවුස් සහ තිනක්කුරල් පුවත් පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය .-* පුත්තලම නගරයේ සිට කුරුණෑගල පාර ඔස්සේ කිලෝමීටර් 2.0ක් ගොස් වමට ඇති අනුරාධපුර මාර්ගයට හැරී (මාර්ග සංවර්ධන අධිකාරියේ කාපට් පාර) එම පාරේ 7 වන සැතපුම් කණුව දක්වා කිලෝමීටර 11.1ක් පමණ ගොස් දකුණු පසින් ඇති චතුරංග මාවතේ (කාපට් කරන ලද ප්‍රාදේශීය සභා පාර) මීටර් 700ක් පමණ දුරක් වම්පස පිහිටි ධර්ම විජය පන්සල දක්වා ගොස් දකුණට හැරී බොරලු සහිත

ප්‍රාදේශීය සභා පාරේ මීටර් 200 පමණ ගිය විට එම පාරට මුහුණලා දකුණු පසින් දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැනුම් මුදලෙන් 10% ක් ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ක් ද (සියයට දෙක හමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3,000)

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළතදී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදල හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදළ තොරතුරු සඳහා කළමණාකරු - ණය අය කරගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 4667218/011-2565573.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
බලයලත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 0812210595, 071-8446374.

12-728

---

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

### අගනා දේපළ වෙන්දේසිය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ, දෙවිනුවර පිහිටි, දෙවිනුවර ප්‍රදීපාගාර පාරේ වරිපනම් අංක 139 දරන ''ගෙදර වත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. පී. සුනිල් මහතා විසින් සාදන ලද 2001.02.07 දතම හා අංක 428 දරන පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දක්වා ඇති බෙද වෙන් කොට නිරූපනය කල සම්පූර්ණ බිම් කොටස.

ප්‍රමාණයෙන් : අක්. 0 රූඩ් 0 පර්. 37.28

අංක 139 ප්‍රදීපාගාර පාර, දෙවිනුවර යන ලිපිනයේ පදිංචි තාරනා දර්ශනී ද සිල්වා සහ අංක 9 සී බද්දේගම පාර, හික්කඩුව ලිපිනයේ පදිංචි වෙදආරච්චි පටබැඳිගේ ප්‍රේමාවතී නොහොත් ප්‍රේමා වෙදආරච්චි යන අය විසින් උකස් කරන ලද දේපළ,

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් මා වෙත පවරන ලද බලතල ප්‍රකාර ඉහත කී දේපළ එහි පිහිටි සෑම සියලු දේ සමග 2017 ජනවාරි මස 10 වැනි දින පෙ. ව. 10.00 ට පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2016.01.29 වැනි දින ගැසට් පත්‍රය ද, 2016.08.29 දින දිනමිණ, ඩේලිනිවුස්, තිනකරන් පුවත්පත් ද බලන්න.

*දේපල වෙත පිවිසෙන මාර්ගය* .- (අංක 139 ප්‍රදීපාගාර පාර, දෙවිනුවර) මාතර නගරයේ සිට තංගල්ල පාරේ දෙවිනුවර පන්සල දක්වා කි. මී. 06 පමණ ගොස් දකුණට හැරී පන්සල වටා ඇති වටරවුම් පාරේ මීටර් 30ක් පමණ ගොස් ප්‍රදීපාගාර පාරේ මීටර් 600 ගියවිට වම් පසින් මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැනුම්කරු විසින් මිල තීන්දු වූ වහාම මතු දක්වෙන ගාස්තු මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 25%ක්,
2. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) දේශීය අලෙවි බද්ද,
3. විකුණුම් මිලෙන් 2.5% ක (සියයට දෙකහමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. රජයේ නියමිත එකතුකළ අගය මත බද්ද (VAT බදු),
5. සියලුම ප්‍රචාරක වියදම,
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500,
7. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් ඉතිරි 75% විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරිය දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 25% මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

වැඩි විස්තර සහ හිමිකම් ඔප්පු හා වෙනත් ලිපි ලේඛන මාතර, උයන්වත්ත, උයන්වත්ත වටරවුම් පාර, අංක 28 බී යන ලිපිනයේ පිහිටි ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ, දකුණු පළාත් කාර්යාලයේ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී 041-2226208, 041-2226209 වෙතින් ලබාගෙන පරීක්ෂා කළ හැක.

එන්. එච්. පී. පී. ආරියරත්න,
උසාවි කොමසාරිස්, තක්සේරු හා
බලයලත් වෙන්දේසිකරු.
කුරුදුවත්ත,
වල්ගම, මාතර.

අංක 14,
ශ්‍රී ධර්මාරාම පාර,
කොටුව, මාතර.
දුරකථන අංක : 071 1885677.

12-700

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ වර්ෂ 2017ක් වූ ජනවාරි මස 04 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභා සීමාව තුළ සහ ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි ඔබේසේකරපුර අංක 514 සී දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත් වැලිකඩ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් මැන සාදන ලද 2012.06.09 දිනැති අංක 4951 දරන පිඹුරේ දක්වෙන ''තුඩුවේකුඹුර'' නමැති ඉඩමෙහි ලොට් 14 දරන කැබැල්ල නමැති දේපළ සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ආදී සියලු දේත් ය.

විශාලත්වය : අ. 0, රූ. 0, පර්. 7.75

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී. සී. ඩී. ෆොන්සේකා විසින් සහතික කරන ලද වර්ෂ 2014ක් වූ අගෝස්තු මස 21 වැනි දිනැති අංක 946 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදුකිරීම චාර්නිකා චම්පිකා මුණසිංහ විසින් ''බන්ධනදායි/උකස්කරු'' ලෙස පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2016.11.25 වැනි දින ඩේයිලි නිවුස්, ලක්බිම, තිනක්කුරල් පුවත්පත් සහ එදින ගැසට් පත ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය .-* බොරැල්ලේ සිට එන්. එම්. පෙරේරා මාවත ඔස්සේ කි. මී. එකක් පමණ ගෝතමී පාර දක්වා ගොස් වමට ඇති පාරෙන් හැරී මීටර් 800ක් පමණ යා යුතු ය. එතැනින් කැබලි කොට විකුණන ලද ඉඩම දෙසින් දකුණට හැරී මීටර් 60ක් පමණ ගිය විට දකුණු පසින් දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය. -* වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලෙන් 10% ක් ද, (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරු කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5%ක් ද (සියයට දෙකහමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3,000).

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකීදේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදළ තොරතුරු සඳහා කළමණාකරු ණය අය කරගැනීම් අංශය, පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර කොළඹ 03.

දුරකථන අංක : 011- 4667218/011-2565573.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
බලයලත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 081 2210595, 071- 8446374.

12-730

---

**ඩී එෆ් සී සී බැංකුව පී එල් සී**

(ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී හි අනුප්‍රාප්තික)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 219 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවට අයත්, සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ නැගෙනහිර කවුඩාන කොට්ඨාස අක 15 අත්තිඩිය පිහිටි ''හීනිරවැල්ල, අත්තිඩිය වෙල්යාය හෙවත් කොළවින්න ඔවිට'' ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 2002 පෙබරවාරි මස 20 වැනි දිනැති අංක 1319 සී දරන පිඹුරේ ලොට් අංක 9 ලෙස දක්වෙන සීමා නිර්ණය කර බෙද වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 12.06
ඉහත කී අංක 1319 සී දරන පිඹුරට අනුව එහි පිහිටි වගාවන් සහ සියල්ල සහිතව.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස මහනගර සභා සීමාවට අයත් සල්පිටිකෝරළේ, පල්ලේපත්තුවේ, නැගෙනහිර කවුඩාන කොට්ඨාස අංක 15 අත්තිඩිය පිහිටි හීනිරවැල්ල,

අත්තිඩිය වෙල්යාය හෙවත් කොළවින්න ඔිවිට ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු සී. ඊ. එන්. ජයවර්ධන විසින් සාදන ලද 1995 සැප්තැම්බර් මස 01 වැනි දිනැති අක 718 දරන පිඹුරේ ලොට් අංක A, B, C සහ D ලෙස දක්වෙන සීමා නිර්ණය කර බෙද වෙන් කරන ලද බිම් කට්ටිය සහ ඒ හරහා ඇති මාර්ග අයිතිය ද සමග.

ඉඩමේ ප්‍රමාණය පිළිවෙලින් ලොට් අංක A අක්. 0 රූඩ් 0 පර්. 30.06 ලොට් අංක B, අක්.0 රූඩ් 0 පර්. 37.56,

ලොට් අංක C අක්. 0 රූඩ් 0 පර්. 29.34 සහ ලොට් අංක D අක්. 0 රූඩ් 0 පර්. 18.23

ඉහත කී අංක 718 දරන පිඹුරට අනුව.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මනෝරි කුමුදිනී ලියනගේ විසින් සහතික කරන ලද 2010 අගෝස්තු මස 20 වැනි දිනැති අංක 219 දරන උකස්කරය ප්‍රකාර කොළඹ පිහිටි ශාන් ඉම්පෝර්ට් එක්ස්පෝර්ට් කම්පනි නම් තනි පුද්ගල ව්‍යාපාරය පවත්වාගෙන යන ශන්මුගදාස් දේවානන්දන් විසින් ඩී එෆ් සී සී බැංකුව පී එල් සී (ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී හි අනුප්‍රාප්තික) ට උකස් කරන ලදුව, ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2017 ජනවාරි මස 05 වැනි දින (බ්‍රහස්පතින්ද) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 91,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම්, වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011- 2371371.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 125 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

12-589

---

HNB 10 - 09.

## හැටන් නැෂනල් බැංකුව පීඑල්සී - වෙන්නප්පුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දවූ ද 2006.09.13 අංක 1669 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම වර්ණකුලසූරිය ප්‍රභාත් නිරන්ජන් ලෝ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

හැටන් නැෂනල් බැන්ක් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2017 ක් වූ ජනවාරි මස 17 වැනි දින පෙ.ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානවලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.* - වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ පිටිගල කෝරළේ දකුණ කම්මල් පත්තුවේ, කම්මල උතුර ගමේ කපුගහවත්ත කුඹුරුබිම නමැති ඉඩමට බලයලත් මානක එම්.පී. එස්. සමරතුංග විසින් මැන සාදන ලද 2003.07.04 දින සහ අංක 5346 A දරන පිඹුර ප්‍රකාර බෙද වෙන් කරන ලද ලොට් අංක 1 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ.

විශාලත්වය රූඩ් එකයි පර්චස් දහතුනයි දශම හතරක් (අ. 0 රූ. 1 පර්. 13.4)

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා* : 2009.10.23 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2009.10.26 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - කොළඹ පුත්තලම මහා මාර්ගයේ බෝලවත්ත හංදියට ගොස් ඉන් දකුණට හැරී හොටෙල් ඩොල්ෆින් පාරේ මීටර් 200ක් පමණ යන විට කැබලි කරන ලද දේපළ හමුවේ. එතැනින් තවදුරටත් මීටර් 50ක් පමණ දකුණු පැත්තට යනවිට එම පාරේ දකුණු පැත්තේ මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංක් පී.එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නො ගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංක : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස් තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777 - 378441
0714 - 424478
ෆැක්ස් අංකය : 0112 - 509442

12-651

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.